# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

# කාර්ය මණ්ඩල පුරප්පාඩු

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින්, ජාතික නෛතික අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පරිචයන් (SARPs) හට අනුකූල වන ආරක්ෂිත, ප්‍රවේශම් සහිත, කාර්යක්ෂම හා පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන් සේවා පද්ධතියක් මනාලෙස ස්ථාපිත නියාමන කාර්ය රාමුවක් යටතේ උපාය මාර්ගික සැලසුම්කරණය, වෘත්තීය මාර්ගෝපදේශ හා දැඩි ආවේක්ෂණය තුළින් සහතික කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් පහත සඳහන් තනතුරු පිරවීම සඳහා කාර්යක්ෂම, උද්‍යෝගිමත් හා ස්වයං-අභිප්‍රේරිත සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයෙහි ඉතා ඉහළ සුදුසුකම් හා දීර්ඝ පළපුරුද්ද සහිත අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ (ප්‍රමිතිය සහ අභ්‍යන්තර විගණන) (තත්ව සහ අභ්‍යන්තර විගණන)

**තනතුරු කේතය : HH-1-1D11 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වැටුප :** (වැටුප් පරිමාණය (HM 1-1) - රු. 140,640-15X4,100-202,140-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව - 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලුම දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 251,319.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිත කරන්නේ නම් රු. 50,000.00 ක ප්‍රවාහන දීමනාව ඇතුළත්ව)
- ඉන්ධන දීමනාව මසකට ලීටර් 115 ක වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින ඉන්ධන මිල ගණන් ප්‍රකාරව)
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගණකාධිකරණය, වාණිජ්‍ය, කළමනාකරණ හෝ පරිපාලන ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්

**සමග**

2. ගණකාධිකරණ, වාණිජ්‍ය, මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters') හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

**සහ**

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික සමාගමක විගණන හෝ මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වසර දහයක (10) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 2**

1. විගණන හෝ මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ කළමනාකරණ කාණ්ඩයේ (MM1-1) ශ්‍රේණිය 1 තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සහ**

2. පසුගිය වසර පහ (05) සඳහා නිකැලැල් සේවා වාර්තාවක් පවත්වාගෙන තිබීම සහ වර්තමාන තනතුර සඳහා අදාළ වන සියලුම වැටුප් වර්ධක ලබාගෙන තිබීම.

**සහ**

3. පසුගිය වසර පහ (05) සඳහා වාර්ෂික කාර්යය සාධන ඇගයුම් වලදී "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

## අධ්‍යක්ෂ (පරිසර පර්යේෂණ සහ ව්‍යාපෘති)

**තනතුරු කේතය : HM-1-1-D4, තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වැටුප :** (වැටුප් පරිමාණය (HM 1-1) - රු. 140,640-15X4,100-202,140-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව - 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලුම දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 251,319.00 වේ. (තමන්ගේනම වාහනයක් භාවිත කරන්නේ නම් රු. 50,000.00 ක ප්‍රවාහන දීමනාව ඇතුළුව)
- ඉන්ධන දීමනාව මසකට ලීටර් 115 ක වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින ඉන්ධන මිල ගණන් ප්‍රකාරව)
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 1**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පර්යේෂණ, සංවර්ධන සැලසුම්, විද්‍යාව, කළමනාකරණ, වාණිජ්‍ය හෝ කලා ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්. කෙසේ වුවද පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හිමි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.ෙ
2. පශ්චාත් උපාධියක් (Masters') හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය සහ
3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික සමාගමක පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වසර දහයක (10) පළපුරුද්ද.

**විකල්ප - 2**

1. පශ්චාත් උපාධියක් (පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයේ ) හෝ පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයට අදළ පිළිගත් වෘත්තීය වරලත් ආයතයක පූර්ණ සාමාජිකත්වය.

**සහ**

2. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික සමාගමක පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වසර දහතුනක (13) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 2**

1. පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයේ කළමනාකරණ කාණ්ඩයේ (MM1-1) ශ්‍රේණිය 1 තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

2. පසුගිය වසර පහ (05) සඳහා නිකැලැල් සේවා වාර්තාවක් පවත්වාගෙන තිබීම සහ වර්තමාන තනතුර සඳහා අදළ වන සියලුම වැටුප් වර්ධක ලබාගෙන තිබීම.

සහ

3. පසුගිය වසර පහ (05) සඳහා වාර්ෂික කාර්යය සාධන ඇගයුම් වලදී "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

## අධ්‍යක්ෂ (මූල්‍ය සහ ආදායම් කළමනාකරණ)

**තනතුරු කේතය : HM-1-1-D10 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වැටුප :** (වැටුප් පරිමාණය (HM 1-1) - රු. 140,640-15X4,100-202,100-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව - 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 251,319.00 (තමන්ගේම වාහනයක් භාවිත කරන්නේ නම් රු. 50,000.00 ක ප්‍රවාහන දීමනාව ඇතුළුව)
- ඉන්ධන දීමනාව මසකට ලීටර් 115 ක වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ දී පවතින ඉන්ධන මිල ගණන් ප්‍රකාරව)
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගණකාධිකරණ, වාණිජ්‍ය, කළමනාකරණ හෝ පරිපාලන ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්

**සමග**

2. මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters') හෝ අදළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

**සහ**

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික සමාගමක මූල්‍ය කළමනාකරණ හෝ විගණන ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වසර දහයක (10) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 2**

පහත සියල්ල සපුරා තිබීම.

1. මූල්‍ය කළමනාකරණ හෝ විගණන ක්ෂේත්‍රයේ කළමනාකරණ කාණ්ඩයේ (MM1-1) ශ්‍රේණිය 1 තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
2. පසුගිය වසර පහ (05) සඳහා නිකැලැල් සේවා වාර්තාවක් පවත්වාගෙන තිබීම සහ වර්තමාන තනතුර සඳහා අදළ වන සියලුම වැටුප් වර්ධක ලබාගෙන තිබීම.
3. පසුගිය වසර පහ (05) සඳහා; වාර්ෂික කාර්යය සාධන ඇගයුම් වලදී "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

## සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් යානා පියාසර මෙහෙයුම්)

**තනතුරු කේතය : MA 5-3-OP1 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වැටුප :** (වැටුප් පරිමාණය (MA 5-3) - රු. 79,440-10X2,040- 15X2,230-144,440-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව - 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 166,117.00
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරු හට දළ වශයෙන් රු. 270,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාවක් හිමිවේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන්**

උපකරණ වර්ගීකරණය සහිත වාණිජ නියමු බලපත්‍රය හා ෆෝසන් (Frozen) ගුවන් නියමු බලපත්‍ර පිටසන.

සහ

උපදේශන පැය 500 ට නොඅඩු පියාසර උපදේශන ශ්‍රේණිගත කිරීමක් හෝ පැය 1000 ට නොඅඩු මුළු පියාසර පළපුරුද්දක් තිබීම.

## සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණ - මෙහෙයුම්)

**තනතුරු කේතය : MA 5-3-AN 1 තනතුරු ගණන - 01**

## සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණ ප්‍රමිති හා ක්‍රියාපටිපාටි)

**තනතුරු කේතය : MA 5-3-AN 4 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වැටුප :** (වැටුප් පරිමාණය (MA 5-3) - රු. 79,440-10X2,040-15X2,230-144,440-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව, 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 166,117.00.
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරු හට දළ වශයෙන් රු. 130,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාවක් හිමි වේ.
- අධිකාරිය විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 01**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් භෞතික විද්‍යාව, ප්‍රවාහනය, ගගන කර්මාන්ත, තොරතුරු තාක්ෂණ හෝ ඉංජිනේරු ධාරාවේ වසර තුනකට (03) නොඅඩු කාලයක විද්‍යා ප්‍රථම උපාධියක් සමග එක් (01) අවුරුදු විධායක ශ්‍රේණියේ පළපුරුද්ද හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉහත ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**විකල්ප - 02**

රේඩාර් ගුවන් ගමන් පාලකවරයකු ලෙස රේඩාර් ශ්‍රේණිගත සහිතව වසර දහයට (10) නොඅඩු පළපුරුද්ද.

## සහකාර කළමනාකරු (මානව සම්පත් කළමනාකරණ)

**තනතුරු කේතය : MA 5-3 HR 5 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වැටුප :** (වැටුප් පරිමාණය (MA 5-3) - රු. 79,440-10X2,040- 15X2,230-144,440-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව - 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 166,117.00
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප 1**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණ, පරිපාලන සහ වාණිජ්‍ය ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු කාලයක ප්‍රථම උපාධියක් සමග එක් (01) අවුරුදු විධායක ශ්‍රේණියේ පළපුරුද්ද හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් අදළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

**විකල්ප 2**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද තනතුරට අදළ විෂය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහිකයක් ලබා තිබීම සමග වසර එකක විධායක පළපුරුද්ද හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් නිකුත් කළ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත විකල්ප 1 හෝ 2)**

**විකල්ප - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 2**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ, සිවිල් ගුවන් සේවා සහකාර/ නිලධාරී ශ්‍රේණිය II තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව**

| තනතුර | වයස් සීමාව | සටහන |
|---|---|---|
| අධ්‍යක්ෂක | අවුරුදු 35 සිට අවුරුදු 55 | මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ, දේශීය ගුවන් සේවා හා පියාසර පාසල්වල අයදුම්කරුවන් හට අදළ නැත. |
| සිවිල් ගුවන් සේවා පරීක්ෂක සහකාර කළමනාකරු | අවු 22 සිට අවු. 45 | |

- වැඩිදුර විස්තර, රැකියා විස්තරය, විශේෂ තාක්ෂණ දීමනාව සඳහා අවශ්‍ය සුදුසුකම් හා සම්මත අයදුම්පත්‍ර ආකෘතිය CAASL ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.caa.lk වෙතින් බාගත කළ හැක.
- යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026-03-23 දින හෝ ඊට පෙර employment@caa.lk විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ඉදිරිපත් කළ යුතුය. විද්‍යුත් ලිපියෙහි ශීර්ෂය තීරුවෙහි අයදුම්කරනු ලබන තනතුර/තනතුරු අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය. සියලුම අයදුම්පත් ලැබුණු බවට දැනුම් දෙනු ලැබේ.
- අයදුම්කරුවන් විසින්, අයදුම්කරනු ලබන තනතුර/තනතුරු සඳහා වන සුදුසුකම් තහවුරු කරනු පිණිස සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.
- **අදාළ සම්මත අයදුම්පත්‍ර ආකෘතිවලින්** යොමු කරනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. රාජ්‍ය ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත්, අදළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.
- තනතුරු කිහිපයකට අයදුම්කරන්නේ නම් එක් එක් තනතුරක් සඳහා වෙන්වෙන් වශයෙන් අයදුම්පත් එවිය යුතුය.
- සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ/ විභාග සඳහා කැඳවනු ලබයි.

**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,**
**අංක 152/1, මිනුවන්ගොඩ පාර,**
**කටුනායක.**
**2026-03-08**